# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1994 අංක 15 දරන
# ශ්‍රී ලංකාවේ බණ්ඩාරවෙල සුවමඩු සුවසෙත සුවසේවා නිකේතනය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1994 ජූනි මස 20 දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී**

---

1994 ජූනි මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල : ශත 90 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1994 අංක 15 දරන ශ්‍රී ලංකාවේ බණ්ඩාරවෙල සුවමඩු සුවසෙත සුවසේවා නිකේතනය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1994 ජූනි මස 20 වන දින]

එල්. ඩී.—ඕ. 67/92

**ශ්‍රී ලංකාවේ බණ්ඩාරවෙල සුවමඩු සුවසෙත සුවසේවා නිකේතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"ශ්‍රී ලංකාවේ බණ්ඩාරවෙල සුවමඩු සුවසෙත සුවසේවා නිකේතනය" යනුවෙන් හැඳින්වෙන සහ සඳහන් කරනු ලබන නිකේතනයක් එහි සාමාජිකයන් විසින් එකඟ වූ රීතිවලට අනුකූලව ඒ ආයතනයේ පරමාර්ථ සහ ඊට සම්බන්ධ සියලු කාරණා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා මෙතෙක් බණ්ඩාරවෙල පිහිටුවා තිබුණු හෙයින් ද : **පූර්විකාව.**

එකී ආයතනය පිහිටුවන ලද්දේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද ඒ විවිධ පරමාර්ථ හා කාරණා ඒ ආයතනය විසින් මෙතෙක් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් ද, එය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද එම ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1994 අංක 15 දරන ශ්‍රී ලංකාවේ බණ්ඩාරවෙල සුවමඩු සුවසෙත සුවසේවා නිකේතනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **කෙටි නාමය.**

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට හා ඉන්පසු (මෙහි මින්මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකාවේ බණ්ඩාරවෙල සුවමඩු සුවසෙත සුවසේවා නිකේතනයෙහි දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට මෙහි මින්මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් "ශ්‍රී ලංකාවේ බණ්ඩාරවෙල සුවමඩු සුවසෙත සුවසේවා නිකේතනය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එම සංස්ථාවට පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඇත්තේ ය. තවද, එම නාමයෙන් සියලු අධිකරණයන්හි සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. **ශ්‍රී ලංකාවේ බණ්ඩාරවෙල සුවමඩු සුවසෙත සුවසේවා නිකේතනය සංස්ථාගත කිරීම.**

3. සංස්ථාව සංස්ථාගත කරනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— **සංස්ථාවේ පොදු පරමාර්ථ.**

(අ) ස්වදේශීය හා ආයුර්වේද වෛද්‍ය ක්‍රම ඉගැන්වීම සඳහා වූ ආයතනයන් පවත්වීම හා පරිපාලනය කිරීම ;

(ආ) වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම සඳහා ආයුර්වේද රෝහලක් පිහිටුවීම ;

2- ජ 022666—7,380 (92/05)

(ඇ) ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ඉගෙන ගැනීම සඳහා සුදුසු තැනැත්තන් තෝරා ගැනීම පිණිස විභාග පැවැත්වීම ;

(ඈ) ආයතනයේ ප්‍රයෝජනය සඳහා අවශ්‍ය ගොඩනැගිලි ඉදි කිරීම, ඒවාට අවශ්‍ය උපකරණ සැපයීම සහ එම ගොඩනැගිලි පවත්වාගෙන යාම ;

(ඉ) ආහාරවලින් සහ ඇඳුම් පැළඳුම්වලින් ස්වයංපෝෂිත වීම සහ ප්‍රචණ්ඩ ක්‍රියාවලින් තොරව සමගි සම්පන්න ලෙස ශ්‍රී ලංකාවේ ජීවත් වීම සඳහා මඟ පෑදීම ;

(ඊ) මහජනයාගේ යහපත පිණිස සදාතනික බෞද්ධ මූල ධර්ම ඉගැන්වීම ;

(උ) ශාක ඖෂධීය පිළියම්වල ආනුභාවය පිළිබඳ පර්යේෂණ ආරම්භ කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම ;

(ඌ) සංස්ථාවේ පරමාර්ථ සාධා සිදුවීම සඳහා දේශන, සම්මන්ත්‍රණ සහ අනෙකුත් අධ්‍යාපනික වැඩ සටහන් පැවැත්වීම සහ තොරතුරු හා අධ්‍යාපනික කරුණු පළ කිරීම;

(එ) වෛද්‍ය කාර්ය සඳහා ස්වභාව ධර්මය හා ස්වභාව ධර්මයේ සම්පත් යොදා ගැනීම සහ අවනත කර ගැනීම ;

(ඒ) ඖෂධ පැලෑටි තවාන් පිහිටුවා පවත්වාගෙන යාම ;

(ඔ) ඖෂධ උයන් පිහිටුවීම ;

(ඕ) ආයුර්වේද බෙහෙත් වර්ග නිෂ්පාදනය කිරීම සඳහා පර්යේෂණාගාර පිහිටුවීම සහ ආයුර්වේද ඖෂධ බෙදා හැරීම, ආයුර්වේද ඖෂධ අලෙවි කිරීම සඳහා අලෙවි හල් විවෘත කිරීම ;

(ක) ආයුර්වේද ඖෂධ වර්ග ආනයනය කිරීම සහ අපනයනය කිරීම ප්‍රවර්ධනය කිරීම ;

(ඛ) විදේශීය සහ දේශීය සිසුන් සඳහා විදේශීය ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම ;

(ච) විවිධ භාෂා සහ විෂයයන් අධ්‍යයනය කිරීම පිණිස විශ්ව විද්‍යාල මට්ටමේ අධ්‍යාපන පහසුතා ලබා දීම;

(ජ) මෙම ආයතනයට අනුබද්ධ ආයතන පිහිටුවා ඒවා පවත්වාගෙන යාම ;

(ට) යම් කර්මාන්තයක හෝ වෙළෙඳාමක නැතහොත් යම් අපනයන හෝ ආනයන ව්‍යාපාරයක නිරතවීම සඳහා හෝ කෘෂි කාර්මික, කාර්මික සහ වාණිජ ව්‍යවසායන් ආරම්භ කොට පවත්වාගෙන යාම සඳහා යම් තැනැත්තකුට ආධාර දීම, සහාය වීම සහ තාක්ෂණික ශිල්පීය ක්‍රම පිළිබඳව තැනැත්තන් පුහුණු කිරීම සඳහා වැඩ සටහන් සැලසීම ;

(ඩ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීමේ ලා නිරතව සිටින ස්වේච්ඡා සේවකයන්ට සහ වෙනත් තැනැත්තන්ට ශිෂ්‍යත්ව මගින් හෝ මුදලින් හෝ අන්‍යාකාරයකින් ආධාර කිරීම;

(ත) පුස්තකාල පිහිටුවා පවත්වාගෙන යාම සහ පොත්පත්, සඟරා, සමරු කලාප සහ වාර සඟරා ආදියට දායක වීම සහ ඒවා නිකුත් කිරීම;

(ද) සංස්ථාවේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රදර්ශන, ව්‍යාපෘති, දේශන, සම්මන්ත්‍රණ සහ සාකච්ඡා වැඩමුළු, පන්ති, විවාද, සම්මේලන, චාරිකා සහ විනෝද ගමන් ප්‍රවර්ධනය කිරීම, පිළියෙල කිරීම, සංවිධානය කිරීම හා පැවැත්වීම;

(න) ආයුර්වේද සහ දේශීය වෛද්‍ය වේදය සඳහා පර්යේෂණ ආයතනයක් පිහිටුවීම;

(ප) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති වෙනත් සංගම්, සමිති හෝ සංවිධාන සමග සහයෝගීවීම සහ සාහචර්ය වීම;

(බ) සිනමාව, නාට්‍යකරණය, සංගීතය, චිත්‍ර කලාව, මූර්ති ශිල්පය ආදී කලාවන් ඉගැන්වීම සහ වෘත්තීය පුහුණුව ලබාදීම පිණිස වූ ආයතන පිහිටුවා පවත්වාගෙන යාම;

(ම) රූපලාවන්‍යය, ශරීර සෞඛ්‍ය, කායික යෝග්‍යතාව පිළිබඳ වූ ව්‍යායාම සහ පිළිවෙත් ක්‍රම යොදාගැනීම, සහ ඒ කාර්ය සඳහා දේශීය වෛද්‍යක්‍රමය මගින් සංයත සහ හෙදකම් සඳහා වූ කටයුතු කිරීම පිණිස ආයතන පිහිටුවීම සහ පවත්වා ගෙන යාම; සහ

(ය) ඉහත සඳහන් පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා අවශ්‍ය, හිතකර හෝ ආනුෂංගික වන වෙනත් සියලු දේ කිරීම.

4. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් මෙතෙක් භාරගන්නා ලද හෝ මින්මතු භාර ගනු ලබන ත්‍යාග, රික්ථවරණ පැවරීම්, පරිත්‍යාග, ග්‍රාහක මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන සංස්ථාව විසින් නිර්ණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය. සංස්ථාවේ අරමුදල

(2) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී හා කිරීමේදී සංස්ථාව විසින් දරන ලද වියදම් කිසිවක් පියවීම සඳහා සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ මුදල් සහ දේපළ කවර ස්ථානයකින් උද්ගත වුවද, හුදෙක්ම සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහා යොදවනු ලැබිය යුතු ය.

සාමාජික නාම ලේඛනය.

5. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට ඉහතින් මතු දිනයේදී ආයතනයේ සාමාජිකයකු වූ සෑම තැනැත්තකු සහ ඉන් පසුව සංස්ථාවේ සාමාජිකයකු වශයෙන් යථා පරිදි ඇතුළත් කරගනු ලැබූ සෑම තැනැත්තකුගේම නම ඇතුළත් නාම ලේඛනයක් පවත්වාගෙන යාමට සංස්ථාවේ කළමනාකාර කමිටුව විසින් කට යුතු සැලැස්විය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

6. සංස්ථාවේ පරමාර්ථ හෝ ඉන් කිසිවක් ප්‍රවර්ධනය කිරීම හෝ අභිවර්ධනය කිරීම සඳහා අවශ්‍ය, හිතකර හෝ යෝග්‍ය කවර ආකාරයක වුවද ක්‍රියා, කාරණා සහ දේවල් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය, පහත දැක්වෙන දෑ සඳහා බලතල ද ඇතුළුව, සංස්ථාවට ඇත්තේය :—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන ගොඩනැගිලි මිලට ගැනීම, කුලියට ගැනීම, බදු ගැනීම හෝ වෙනත් ආකාරයකින් අත්කර ගැනීම හෝ ලබා ගැනීම ;

(ආ) සංස්ථාවේ කාර්ය සඳහා යම් ඇපයක් මත මුදල් ණයට ගැනීම ;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගණුදෙනු කළහැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට භාර ගැනීමට, වට්ටම් කිරීමට, පිටසන් කිරීමට, ගණුදෙනු කිරීමට, මිලට ගැනීමට, විකිණීමට, නිකුත් කිරීමට සහ ශ්‍රී ලංකාවේ හෝ වෙනත් ස්ථානයන්හි බැංකු ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට, පවත්වාගෙන යාමට සහ වැසීමට ;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් සංස්ථාව සුදුසු යැයි සලකනු ලබන ආකාරයකින් ආයෝජනය කිරීමට ;

(ඉ) සියලුම ආකාරයේ සම්මාදම් මුදල්, ප්‍රදානයන්, පරිත්‍යාග හා ත්‍යාග ඉල්ලා සිටීමට සහ භාර ගැනීමට ;

(ඊ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කරගෙන යාම සඳහා අවශ්‍ය ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට ඇතුළත් වීමට ;

(උ) යම් නිශ්චල හෝ පෞද්ගලික දේපළකට බලපාන යම් නීත්‍යානුකූල භාරයක් ඊට අදාළ කොන්දේසිවලට යටත්ව භාර ගැනීමට, පිළිගැනීමට, ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ පරිපාලනය කිරීමට ;

(ඉ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට, සේවයෙහි නියුක්ත කිරීමට හෝ ඔවුන් සේවයෙන් පහ කිරීමට සහ සංස්ථාව විසින් නිර්ණය කරනු ලබන යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ඔවුන්ට ගෙවීමට.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

7. (1) සංස්ථාවේ කටයුතු අධ්‍යක්ෂ ජනරාල්, ලේකම්, උප ලේකම්වරු දෙදෙනකු, භාණ්ඩාගාරික ද ඇතුළුව පස් දෙනකුට නොඅඩු සාමාජිකයන් සංඛ්‍යාවකින් සමන්විත වූ (මෙහි මින්මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකාර කමිටුවක් විසින් මේ පනතේ වෙනත් විධිවිධානවලට හා සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මුනිදාස පෙරේරා මද්දුම මහතා අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් ඉල්ලා අස්වුවහොත් මිස සංස්ථාවේ යාවජීව අධ්‍යක්ෂ ජනරාල් විය යුතු අතර ඔහුගෙන් පසු අධ්‍යක්ෂ ජනරාල් ධුරයට ඔහුගේ අනුප්‍රාප්තිකයා ඔහු විසින් නම් කරනු ලැබිය යුතු ය. එසේ අනුප්‍රාප්ත වන අධ්‍යක්ෂ ජනරාල්වරයා ද කලින් ඉල්ලා අස්වුවහොත් මිස, යාවජීව අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් වන්නේ ය.

(3) සංස්ථාවේ ප්‍රථම කළමනාකාර කමිටුව, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේදී සංස්ථාවේ කළමනාකාර කමිටුවේ සාමාජිකත්වය දැරුවා වූ ද මෙම පනතේ උප ලේඛනයේ නම් සඳහන් කොට ඇත්තා වූ ද තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ රීති.

8. (1) සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතරයක ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා සෑදීම නීත්‍යනුකූල වන්නේ ය :—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, එක් එක් පංතියට අයත් සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම ;

(ආ) කමිටුව තෝරා පත් කර ගැනීම, නිලධරයන් ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ධුර අත් හැරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ කමිටුවේ සාමාජිකයන්ගේ බලතල, කාර්ය සහ පැවැත්ම ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධාරීන්, අනුයෝජිතයන්, සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ කාර්ය, කර්තව්‍ය සහ පැවැත්ම;

(ඈ) කමිටුවේ, සංස්ථාවේ හෝ යම් අනුකාරක සභාවක රැස්වීම් වල දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම, එම රැස්වීම්වල දී පුරප්පාඩු පිරවීම, ඒ රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ න්‍යාය පත්‍ර, ඒ රැස්වීම්වල ගණපූරණය සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම;

(ඉ) සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම්;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සහ සංස්ථාව විසුරුවා හැරීම.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ආයතනයේ බලපැවැත් වූ රීති, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු අතර, එම රීති මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබන ආකාරයෙන් එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

ආයතනය විසින් ගෙවිය යුතු සහ ආයතනයට අයවිය යුතු ණය.

9. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවති ආයතනයේ සියලුම ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවා නිදහස් කරනු ලැබිය යුතු අතර එදිනට ආයතනයට අයවිය යුතු සියලු ණය හෝ ගෙවිය යුතු දායක මුදල් හා සම්මාදම් මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

10. (1) සංස්ථාවට ලැබුණු හෝ සංස්ථාව විසින් වියදම් කරනු ලැබූ සියලු මුදල් පිළිබඳව නිසි අයුරින් ගිණුම් තැබීමට කමිටුව විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(2) කමිටුව විසින් පත් කරන ලද විගණකවරයකු හෝ විගණකවරයන් විසින්, සෑම වර්ෂයක දී ම යටත් පිරිසෙයින් එක් වරක් සංස්ථාවේ ගිණුම් පරීක්ෂා කොට විගණනය කළයුතු අතර, ආදායම් සහ වියදම් ගිණුමෙහි සහ ශේෂ පත්‍රයෙහි නිරවද්‍යතාව ඔහු හෝ ඔවුන් විසින් සහතික කළ යුතු ය.

11. සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් හා ලේකම් ඉදිරිපිටදී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිර විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය

12. යම් මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු නියෝගයකින් හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් සංස්ථාවේ තත් කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව භාරගැනීමට සහ දැරීමට සංස්ථාවට නීතියෙන් බලය සහ හැකියාව ඇත්තේ ය. තවද, එවැනි සියලුම දේපළ මේ පනතේ කාර්යය සඳහා සහ සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, ඒ දේපළ උකස් කිරීමේ, විකිණීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

13. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් වෙතින්, ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන්ගේ හැර ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනයම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

14. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

උපලේඛනය [7 (3) වගන්තිය]

අධ්‍යක්ෂ ජනරාල් : මුනිදාස පෙරේරා මද්දුම මහතා

ලේකම් : විශාරද ජයන්ත පෙරේරා මහතා

උපලේකම්වරු :

1. කීර්තිරත්න කොස්වින්න මහතා
2. ලංකා චන්ද්‍රනී මද්දුම මෙනවිය

භාණ්ඩාගාරික : කේ. එම්. දීපා සේනානී මෙනවිය

කළමනාකරණ සභාවේ අනෙකුත් සාමාජිකයෝ

කථිකාචාර්ය වෛද්‍ය ආනන්ද [illegible] මහතා

වෛද්‍ය ලතාමිනී වික්‍රමසිංහ මිය

සමන් ප්‍රිය මද්දුම මහතා

කීර්ති ශ්‍රී ගුණනන්ද මහතා

බබලි ප්‍රියජන මද්දුම මහතා

මධුෂානී පෙරේරා මද්දුම මෙනවිය

පාර්ලිමේන්තු විවාද සිංහල පතක් කොටුපිටපත්වල සහ පතක්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 255, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් එවීමෙන් පසුව එළඹෙන [illegible] ලබා ගත හැකිය.